# ජන කවි හා ඒවායේ දක්නට ඇති ආගමික ලක්ෂණ.

කැලණිය විශ්වවිද්‍යාලීය අනුබද්ධිත පාලි හා බෞද්ධ පශ්චාද්
උපාධි ආයතනයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
ව්‍යාපෘති අධ්‍යයන නිබන්ධය.

සජීවා කොඩිතුවක්කු,
විජයලක්ෂ්මී පෙරේරා,
(බී. ඒ. ගෞරව - ශ්‍රී. ජ.)

ලියාපදිංචි අංකය:

පාලි හා බෞද්ධ පශ්චාද් උපාධි ආයතනය,
ගෝතමී වීදිය,
කොළඹ, 08

වර්ෂ 1993 වූ පෙබරවාරි මස 25 දිනදීය.

# පූර්විකාව

ලෝකයේ ජීවීන්ගේ සම්බන්ධය පිළිබඳ ව විමසන විට මිනිසා සෙසු ජීවීන්ගෙන් වෙනස් වන්නේ උසස් මනසක් ඇති නිසා ය. එබැවින් මිනිසාට ප්‍රධාන තැනක් හිමිවෙයි. ඔහුගේ මනසේ ක්‍රියාකාරිත්වය අනුව හොඳ- නරක පිළිබඳ විනිශ්චයක් දීමට පොහොසත් වන මිනිසා, ප්‍රායෝගික ක්‍රියාකලාප ඔස්සේ තාර්කික වුත්, දාර්ශනික වුත්, හැඟීම් මතුකරලීමට සමත්වන බව පෙනෙයි. ඔහුගේ ජීවිතුරු අදහස් හා සංකල්ප හේතු කොට ගෙන සමාජයීය වශයෙන් විශාල මෙහෙයක් ඉටු වන්නේ ය. මිනිසාගේ චින්තන ශක්තිය අනුව අදහස්වල උසස් පහත් බව විනිශ්චය කටයුතු ය. මිනිස්කම යථෝක්ත මානසික ක්‍රියාකාරිත්වය මත ලොව පැතිර යන්නේ සාරධර්ම පද්ධතියට ආගමික කාර්ය හැර වෙනත් විකල්ප ක්‍රියාමාර්ග නොමැති හෙයිනි. මිනිසා පිරිසිදු හෝ අපිරිසිදු අදහසින් ලොව දකින දේ පිළිබඳ ව දියහැකි විනිශ්චය කෙබඳු එකක් ද යන්න ධම්මපදය වැනි ග්‍රන්ථවලින් ප්‍රකාශ වී ඇත.

සුඛෝපභෝගී ජීවිතයට කැමති මිනිසා තම බලාපොරොත්තු සපුරාගැනීමේ අරමුණින් ස්වාභාවික හෝ නොවූ කුමන ක්‍රමයක් තුළින් වුව කෙනෙකුට විපත් ඇති කිරීමට පුරුදුව සිටිනැයි පෙනී යයි. කුසලා කුසල පිළිබඳ විනිශ්චයක් නොසොයා තමා වෙත එල්ලවන අභියෝගවලට අන්‍ය මාර්ගවලින් විසඳුම් සෙවීමට මිනිසා පෙළඹුනි. බෙහෙවින් සැප සම්පත් පිළිබඳ අධික ආශාවෙන් වෙළී ගිය බව ද පෙනෙයි. ඔහු යාතු කර්මවල පිහිට පැතුයේ සුබ - අසුබ කිනම් ක්‍රමයක් මගින් හෝ තම වුවමනාවන් ඉටු කර ගැනීමේ අපේක්ෂාවෙනි. මේ අනුව ශාන්තිදායක අභිචාර විධිවලින් බලාපොරොත්තු වූයේ සැපය යි. අණවින කොඩිවිණ වැනි නාශක අභිචාර විධිවලින් බලාපොරොත්තු වූයේ වෙනත් අයට අයහපතක් කොට තමන්ට සැපයක් අත් කර ගැනීම යි. අන් අයුරකින් කිවහොත් ප්‍රසාදයෙහි සෙත් ශාන්ති කළ අතර අප්‍රසාදයෙහි අණවින, කොඩිවිණ, හූනියම් ආදිය කිරීමට ඔහු ඉටාගත් බව පෙනේ. හේ අනුන්ට කොඩිවිණ කොට තමාගේ පරමාර්ථ ඉටුකර ගැනීමට උත්සාහ කළ අතර, තමන්ට ඇති වූ අපල උපද්‍රව කොඩිවිණ ආදිය කැපීමෙන් නැතිකර ගැනීමට පෙළඹුන බව පෙනේ.

ඈත අතීතයේ සිට භාරතයේ යාතුකර්ම පිළිබඳව විශ්වාස පැතිර ගිය බව නොරහසකි. භාරතයෙහි සිට යාබද රටවලට ද එම මිථ්‍යා විශ්වාස පැතිර ගියා ය. ආක්‍රමණිකයන්ගේ මාර්ගයෙන් ද සංක්‍රමණිකයන්ගේ මාර්ගයෙන් ද ලංකාවට එම විශ්වාස අවතීර්ණ විය. මහායාන ධර්මය මෙරට පැතිර යාම නිසා ඊට සම්බන්ධ යාතු කර්ම රැසක් ද මෙරටට කුලවැද්දුණි. තාවකාලික සුවය පිළිබඳ ව හා සැපසම්පත් පිළිබඳ ව නිතරම සිතූ මිනිසා මෙවැනි යාතු කර්ම කෙරෙහි නැඹුරු වූ බව පෙනේ. සදා කාලික වූ විමුක්තියේ දක්නට ලැබෙන දිගු කාලීන බව නිසා එය ලඝු කොට සැලකූ මිනිසා යාතු කර්ම කෙරෙහි දැඩි ඇල්මක් හා විශ්වාසයක් ඇතිකර ගත්හ.

ලාංකේය ජනසමාජය අතර දක්නට ලැබෙන, පළාත්බද හා ප්‍රදේශ ආශ්‍රිත ව ගොඩ නැංවී ඇති යාතු කර්මවල විවිධ වෙනස්කම් පවත්නා බව පැහැදිලි ය. විශේෂයෙන් උඩරට හා පහතරට, සබරගමු වශයෙන් දක්නට ලැබෙන මේ අංශ විවිධ වූ අවශ්‍යතාවන් මත සකස් වූ යාතු කර්ම ගණයේ ලා සැලකිය හැකි ය. ආගමික අර්ථය මිනිසාගේ ජීවිතයට ලංවීමත් සමග යාතුකර්මවල හරය අර්ථවත් කරන්නට ගත් වෑයම් ද බොහෝදුරට පැහැදිලි වේ. විශේෂයෙන් බුදුන්, දහම්, සඟුන් යන තෙරුවන් පිළිබඳව දක්වන ශ්‍රද්ධා භක්තිය නිසාත් ජාතක සාහිත්‍යයේ එන බොහෝ කථාවලි න් ඇති කර ගන්නා භක්ත්‍යාවනත හැඟීම් නිසාත් අපල දුරු කිරීම මෙන්ම ජීවිතය සඵල කර ගැනීමට ආගම ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රයත්නය අප්‍රමාණව දක්නට ඇත.

උත්තරීතර බුදුගුණයන්හි බලගතුබව හොඳින් වටහා ගෙන බුදුගුණ සිහිකර දී ආතුරයාට සහනය ලබාදීම යාතු කර්ම පැවැත්වීමේ අදහස යි. ආදිකාලීන ජීවිතය දෙස අවධානය යොමු කරන කල්හි පැහැදිලිවන්නේ යාතු කර්ම ජනජීවිතයේ ඉතා අවශ්‍ය දෙයක් වූ බවයි. අපල හා විපත්ති දුරලීමට සුළු හෝ විශාල ප්‍රමාණයේ යාතු කර්ම පැවැත්වීම සාමාන්‍ය මිනිසාගේ සිරිත විය. ඒ සඳහා තමාගේ සැපත වෙනුවෙන් තමා ජීවත් වන භූමි භාගයේ ගස් වෙන් කිරීම, සතුන් තමාගේ නමින් අත්හැරීම, රූපයට රූපයක් භාරවීම හා පඤ්චායුධ වැනි ආරක්ෂක යන්ත්‍ර දරුවන්ගේ කරේ පැළඳවීම වැනි අවස්ථාද සුලබ ය.

මේවායේ දක්නට ලැබෙන බෞද්ධ මුහුණුවර තුළින් ජනජීවිතයේ පරම විශ්වාසය ලෙස පිළිගත් ආගමික සංකල්පනා ද සියුම් ව ක්‍රියාත්මක විය. විවිධ අවස්ථා වල දී මිනිස්

සිතට ඇතිවන බිය පදනම් කරගෙන සැලෙන සිතින් යුතුව ආරාම, වෘක්ෂ, චෛත්‍යයන්හි පිහිට පැතූ බව බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථයන්හි වැනවීත් පැහැදිලි කොට ඇත. (ආරාම රුක්ඛ චේතියානි මනුස්සා භය තජ්ජිතා) තවද බොහෝ අවස්ථාවල දී එබඳු යාතු කර්ම සිදුකරන පුද්ගලයා බෞද්ධ හැඟීම්වලින් පෝෂිත වූ චරිතයකින් සමන්විත වූවෙකි. එපමණක් නොව පාරම්පරිකව සලකා සම්ප්‍රදායානුගතව ඒවා ශිකගෙන යාමට කිසිවිටෙක අමතක නොකළ බව පෙනේ.

විශේෂයෙන් යාතු කර්ම සඳහා භාවිත කෙරෙන බොහෝ යාග භාණ්ඩ හා උපාංග පිළිබඳ ව කරුණු විමසාබැලීමේ දී ඒවා අර්ථවත්ව ඇත්තේ බෞද්ධ අදහස් සමූහයකිනි. උදාහරණයක් වශයෙන් බුලත් පදය හා බුලත් උපත පිළිබඳ ව දක්වන තොරතුරු දී නාග භවනය බුලත් උපතට සම්බන්ධ කෙරෙහි. ඒ එක්කම බුදුන්වහන්සේගේ වාසස්ථානයක් වශයෙන් ද හඳුන්වයි. කෙසේ වුවත් යාතු කර්මවල ඓතිහාසික පරිණාමය තුළ දක්නට ලැබෙන බෞද්ධ මුහුණුවර ආගමික ඉතිහාසය පැහැදිලි වන්නට මගකි.

මෙවැනි කෙටි නිබන්ධනයකින් මා බලාපොරොත්තුවූයේ විවිධ යාතු කර්ම එහි පරමාර්ථය, ප්‍රයෝජනය මොනවාදැ යි කෙටියෙන් පැහැදිලි කිරීමට ය. ඉන් ලැබෙන පිහිට පාඨක ඔබට යම් ධෛර්‍යයක් මෙන් ම ප්‍රයෝජනයක් වන්නේ නම් එය මාගේ සැනසීමට හේතුවකි.

සම්පාදක.

---